# ජල රැකුම ගැන පැරණි මත

"මට අයිති රාජ්‍යයෙහි අහස් දියෙන් ගොයම් කරන කුඹුරු හැර අනවරතයෙන් දියඇදි නදින්ගෙන් හා එසේම මහ වැව් දිය හේතු කොට ගෙන ගොයම් කටයුතු කෙත්‍රද විරලය. බොහෝ වූ පර්වතයෙන්ද ඝණ වන ලැහැබ් වලින්ද කර්දමස්ථානයෙන්ද මාගේ රාජ්‍යය අත්‍යන්තයෙන් සංකටවේ. මෙබඳු වූ දේශයෙහි වර්ෂාවෙන් ලැබෙන්නාවූ ජලය කිසිකලෙකත් ලෝකයාට අප්‍රයෝජනව මුහුදට සාගරයට නොවදින නිසා වැව් ආදිය කරවිය යුතුය. ස්වර්ණ මාණික්‍යාදී වස්තූන් උපදනා භූමිභාග හැර සෙසු තැන්හි යහපත්ව කුඹුරු කරවීම යුතුය. ලෝකාර්ථයෙහි නො මයා ද ස්වහස්තගත යමක් තනිව අනුභව කොට විසීම මාවැනියන්ට සියලු අන්දමින් තරම් නොවේ. එබැවින් නෙපි සියල්ලෝම දුෂ්කර වූ කටයුතු පැමිණි කල්හිද මේ දුෂ්කරයයි සිතා නොපසුබට වීර්ය ඇතිව නිරවශෙෂයෙන් මාගේ සංවිධානය පරිද්දෙන් නොවරදවා කර්මාන්ත සම්පාදනය කරව".

— මහා පරාක්‍රමබාහු රජතුමා

වතුර ලබා ගැනීම සඳහා බොහෝ වෙහෙස මහන්සි දරා පැරණි සිංහලයෝ තමන්ට තිබුණු කුඩා ආයුධ සහ උපකරණවලින් ගංගාදිය හරහා යෝධ කණ්ඩි සෑදුවෝය. අමුණුවල කැපූ ගල් වලට මතුපිටින් පිඩලි ගෑසීම ඔවුන්ට පුරුදුව තිබුණේය. ගල් සියල්ලම ඒ ඒ තැන්වල නො සෙල්වී තිබීමට මේ පිඩලි ගෑසීම හේතුවීය" යනුයි. වැව් අමුණුවල තත්ත්වය සලකා බැලූ ප්‍රිඩහම් මහතා පහත සඳහන් තීරණයට බැස තිබේ. "ලංකාව වරක් ඉතා විශාල ජනගහනයකින් පිරී තිබූන බව සිතන්ට ඉඩ තිබේ. දිවයිනේ තිබෙන ගංගා හොයවල් ඉතා වේගස්වත සුළුය. කඳු අතරට දවස් ගණනක් තුළ ධාරානිපාත යෙන් වසින වර්ෂාව නිසා ගංගා වල් පිරී දෙගොඩ තලාගිය විට ගංවතුරේ වේගය සාමාන්‍ය බැම්ම කට ඉසිලිය නොහැකි තරම්ය. මේ බව දැනගත් සිංහලයෝ කඳු හෙල් අතරෙන් ගලා බසින සැඩ පහරේ වේගය ඉසිලීමට තරම් ශක්තිමත් බැමි බැන්දෝය."

- සර් එමර්සන් ටෙනන්ට්

"රැස් කරන ලද ජලය වැවේ වීකක්වත් තිබෙනතුරු එය කිසි අවහිරයක් නැතිව සෑදූ ඇලවල් මඟින් පිටත ගැනීමට වැවේ පතුලෙන්ම සොරොව්ව සාදන්ට ඔවුන්ට සිදුවිය. මෙසේ සෑදීමේදී බොහෝ අවස්ථාවල මේ සොරොව්ගල් මැදින් හාරා තනාන්ට සිදුවිය. අගල් තැනීම ආදියේ වෙහෙස මදකුදු අඩුකිරීමට පවා යන්ත්‍ර ක්‍රමයකුත් නොමැතිවද යොධයන්ට පවා අමාරුවෙන් කළ හැකි අසීරුකම් වලට මුහුණ පාමින් ඔවුන් විසින් පෙන්වන ලද දෘඪතර උත්සාහය මේ භෂ්යාව ශේෂයෝ සවිස්තරව ලොවට දක්වති."

- වෙනත්වගේ පොතින්

"කුඹුරුවලට වතුර ගෙනයන ඇල වැවෙන් පිටවන තැනක් ඇසට නො පෙනේ. නමුත් අවුරුද්ද මුළුල්ලේම නොසිඳී පවතින ඒ ඇලෙහි වතුර වැව් අඩිය යටව පිහිටා තිබෙන සොරොව්වක් මගින් ප්‍රමාණ කර තිබෙන බව නිසැකය. අභිනව ඉංජිනේරුවන්ට මේ සොරොව්වේ ක්‍රියා කිරීමේ පිළිවෙළ විස්තර කළ නොහැකි වුවත් පැරණියන් එයින් අදහස් කළ ප්‍රයෝජනය ලැබූ බව සිතන්ට ඉඩ තිබේ"

- ආණ්ඩුකාර සර් හෙන්රි වෝඩ්

මෙපර කල කරන ලද අති විශාල වැව් කර්මාන්ත සමහරවිට ලක්දිව තරම් ලොව අන්කිසි රටක දක්නට නොලැබෙන්නේය යනු මගේ විශ්වාසයයි. තවද මෙරට ඒ ඒ සීමා ඇතුළත දක්නට ලැබෙන තරම් වැව් අමුණු කර්මාන්ත අන්රටක ඒ තරාතිරමේ සීමා ඇතුළත දක්නට දුෂ්කර විය යුතුයි. මෙතරම් කුඩා වූ අන් රටක මෙසා පැරණි වූද, විශාලවූද, සංඛ්‍යාවෙන් උසස් වූද වැව් අමුණු තවත් ඇතැයි සිතිය නොහේ.

යුරෝපයේ ගොවි කර්මාන්තය බොහෝ අශාස්ත්‍රීයයේ අක්‍රමවත්ව පහත් අඩියක පැවති කාලයෙහි මෙරට මිනිසුන් ඉතා වෙහෙසදරා දක්ෂ ලෙසද ශාස්ත්‍රානුකූලවද තැනූ අප්‍රමාණ වැව් අමුණු වලින් නිසරු ප්‍රදේශයෝ සාරවත් වූහ. ධන ධාන්‍යයෙන් ආඩ්‍යව බැබලුනාහ. පළමුකොට ගොවිකම් ගැන දැන ගැනීම ජලාසයන් සෑදීම සහ ඉඩම් අස්වැද්දීම යන ආදී කරුණු පිළිබඳව ලක්වැස්සෝ විජය රජුට සහ එතුමාගේ අවැමෙන් රජ පැමිණි රජ දරුවන්ට ණය ගැත්තෝ වෙති.

ආර්. ඇල්. බෝනියර්